# දික්කසාද යේ දිගුකාලීන සමාජ බලපෑම පිළිබඳ ව විචාරාත්මක අධ්‍යයනයක්

Hemamali Nelangani Karunarathne, Department of Pali & Buddhist Studies, University of Kelaniya, Candidate for M.Phil, University of Kelaniya

විදේශීය භාෂාවන්හි සංකලනයෙන් වත්මන් ව්‍යවහාර සිංහලය සකස් වී ඇති අතර "කසාදය" හා " දික්කසාදය " යන වචන දෙක ද පෘතුගීසි බසින් සිංහලයට එක්ව ඇතැයි කිය වේ. පෘතුගීසි බසින් " කසාර්" යනු ගෙයයි. ගෙයක් නඩත්තු කරන්නා විවාහකයා යන අරුතින් " කසාර් " යන වචනය ව්‍යවහාරයට පත් අතර කසාදයෙන් වෙන්වීම " දික්කසාර් " නොහොත් " ඩිෂ්කශාඩෝ " එසේත් නැත්නම් සිංහල උච්චාරණයට අනුව "දික්කසාදය" නම් විය.

විවාහ සම්බන්ධතාවය විධිමත් ආකාරයකින් අවසන් කිරිම නැතහොත් එයින් වෙන් වීම දික්කසාදය ලෙස මැක්මිලන් මානව විද්‍යා ශබ්ද කෝෂය අර්ථ දක්වයි.

නීතිමය හා සමාජමය යන සාදක දෙක මෙහී දි "විධිමත් " යන්නෙන් අදහස් කර ඇත. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය දික්කසාදය අර්ථ දක්වන්නේ " විවාහයට පත් අඹු-සැමියන් නීත්‍යානුකූල සේ වෙන්වීම දික්කසාදය නම් වේ" යනුවෙනි.

මනෝ වෛද්‍ය විශේෂඥවරියක වන චිත්‍රා මුන්ෂි වරක් පවසා තිබුණේ මිනිසුන් දික්කසාද වන්නේ ඇයි ඊ යන කාරණය පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට නම් ඔවුන් විවාහ වන්නේ ඇයි යන්න සොයා බැලිය යුතු බව යි. පුද්ගලයා විවාහය තුළින් අපේක්ෂිත අවශ්‍යතාවයන් සපුරා ගැනීමට නො හැකි තැන " දික්කසාදය " සඳහා යොමු වේ.

නීත්‍යානුකූල භාෂා ව්‍යවහාරය තුළ " දික්කසාදය" යන්න සාමාන්‍ය දෙයක් වුව ද ස්ත්‍රියකට හා පුරුෂයකුට ප්‍රායෝගික ජීවිත යේ ඉන් ලැබෙන පීඩනය ඉතා විශාල වූවකි. දික්කසාදය තුළින් කායික හා මානසික පීඩනයක් ඇතිවන්නේ දික්කසාද වන දෙදෙනා ට පමණක් නොවේ. ඔවුන්ගේ දූ දරුවන් ද ඒ තුළින් මහත් වූ පීඩාවකටත් අසරණ භාවයකටත් පත්වේ. පවුලේ අනෙකුත් සාමාජිකයන් වෙත ද මෙහි සෘජු බලපෑම් අත්විඳින්නට සිදු වේ.

ශ්‍රී ලාංකික සමාජ යේ "දික්කසාදය" පිළිබඳ තත්ත්වය විමර්ශනය කිරීමේ දී, විවිධ සමාජ ආර්ථික තත්ත්වයන් ද, පුද්ගලයා ජීවත්වන සමාජ වකවානුව සහ පුද්ගලයාගේ රැකියාව හා එහි වෙනස්කම් ද, ජනවාර්ගික ගැටලු හා විවිධ සංස්කෘතික ඇගයීම් ආදිය ද, විවාහයට මෙන් ම දික්කසාදයට ද බෙහෙවින් බලපාන බව පෙන්වාදිය හැකි ය. විවිධාකාරයේ සමාජ ගැටලු නිර්මාණය වීමෙහිලා "දික්කසාදය" සෘජුව ම බලපෑමක් ඇති කරන අතර, විශේෂයෙන් ප්‍රධාන සමාජ සංස්ථාව වන "පවුල් සංස්ථාව" බිඳ වැටී ම හේතුකොට ගෙන, ඒ හා බැඳුණු අනෙකුත් සමාජ සංස්ථා අතර පවතින සම්බන්ධතාවයන් බිඳ වැටීම මෙහි දි සමාජ විසංවිධානය ඇති වීම කෙරෙහි මූලික හේතු සාධකයක් වන බව පෙන්වා දිය හැකි ය. දික්කසාදයේ දි ඇතිවන එකී සමාජීය බලපෑම වර්තමානයට මෙන් ම අනාගතයට ද නිශේධනාත්මකව බලපෑම් කරන ආකාරය සාකච්ඡා කිරීම මෙම පර්යේෂණ පත්‍රිකා වේ අරමුණ යි.

ප්‍රමුඛ පද : පවුල, දික්කසාදය, සමාජ විසංවිධානය